1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2024.12. 10 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 03/2024**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනය කිරීම</u>**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2024.06.25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 40 මගින් ප්‍රසම්පාදන බල අධිකාරී සීමා කිහිපයක් සංශෝධනයකට ලක් කර ඇත. එම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේකය පදනම් කර ගනිමින්, ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 03/2016 හි සඳහන් ප්‍රසම්පාදන අධිකාරී සීමා පහත පරිදි සංශෝධනය කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2024.10.01 දින සිට දකුණු පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය, ආණ්ඩුකාර ලේකම් ගේ අංක G/SP/1/1/2/2024 (i) දරන 2024.12.09 දිනැති ලිපිය මඟින් ලබා දී ඇත.

02. මෙම චක්‍රලේඛය බලාත්මක වීමත් සමඟ ප්‍රසම්පාදන කමිටු සීමා සම්බන්ධයෙන් මින් පෙර මවිසින් නිකුත් කරන ලද 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016**, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016 (I)**, 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016 (II)**, 2019.01.16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016 (III)**, 2020.07.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016 (IV)** සහ 2022.03.02 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **03/2016 (V)** මෙයින් අවලංගු කරනු ලැබේ.

03. එබැවින්, පහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රමවලට අදාළ ප්‍රසම්පාදන කමිටු සීමාවන් අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසත්, මෙහි සඳහන් නියමයන් හා උපදෙස් පිළිපදින ලෙසත්, ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ වන සියලු ආයතන මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් කාරුණිකව දන්වමි.

**<u>මුදල් රීති 422 - සංශෝධිත ප්‍රසම්පාදන කමිටු සීමා</u>**

**422.1 (අ) භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1, 3.2 සහ 3.3), සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීමේ දී**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

| |
|---|
| **1. ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේ දී එක් එක් ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව සලකා බැලිය යුතු ය.**<br><br>**2. කුලී සහ කල්බදු සම්බන්ධයෙන්, ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේ දී සම්පූර්ණ කුලී හෝ කල්බදු කාලය සඳහා කොන්ත්‍රාත්තුවේ වටිනාකම සලකා බලනු ලැබේ.** |

| ප්‍රසම්පාදන කමිටුව | අධිකාරී සීමාව (රු. මිලියන) | | |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා රජයේ අරමුදල්ගත ව්‍යාපෘති | විදේශ අරමුදල්ගත ව්‍යාපෘති | |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව | 750 ට වැඩි | 1,500 ට වැඩි | |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | 750 දක්වා | 1,500 දක්වා | |
| පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | 400 දක්වා | 800 දක්වා | |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | - | ඉදිකිරීම් | 300 දක්වා |
| | | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 150 දක්වා |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | 50 දක්වා | 100 දක්වා | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | 10 දක්වා | 10 දක්වා | |

**422.1 (ආ) භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළෙඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේ දී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)**

| |
|---|
| **1. සැපයුම් හා සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිල ගණන් කැඳවිය හැකි ය.**<br><br>(අ) ශ්‍රී ලංකා ටෙලිකොම් දේදුනු පිටුවල (Rainbow Pages) ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට වෙළෙඳුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්)<br><br>(ආ) ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් (අදාළ වේ නම්)<br><br>(ඇ) විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය (e-GP) යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන් (www.promise.lk)<br><br>**2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධාන ද ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවිය හැකි ය.**<br><br>අදාළ අවස්ථාවන්වල දී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛන භාවිත කළ යුතු ය. එසේම කලින් දැනුම් දුන් දිනෙක ලංසු බාර ගැනීම අවසන් කළ යුතු අතර, එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කළ යුතු ය. |

| **ප්‍රසම්පාදන කමිටුව/ අධිකාරිය** | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4 අනුව අවම වශයෙන් මිල ගණන් 05 ක් කැඳවිය යුතු ය.** | **අධිකාරී සීමාව (රු.මිලියන)** | |
|---|---|---|---|
| | | **ශ්‍රී ලංකා රජයේ අරමුදල්ගත ව්‍යාපෘති** | **විදේශ අරමුදල්ගත ව්‍යාපෘති** |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | ඉදිකිරීම් වැඩ | 40 දක්වා | 40 දක්වා |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 25 දක්වා | 35 දක්වා |

| | | | |
|---|---|---|---|
| පළාත් අමාත්‍යාංශ / නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) කාර්යාල ප්‍රසම්පාදන කමිටුව | ඉදිකිරීම් වැඩ, භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 20 දක්වා | 30 දක්වා |
| පළාත් දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ඉදිකිරීම් වැඩ, භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 6 දක්වා | 6 දක්වා |
| **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4 අනුව අවම වශයෙන් මිල ගණන් 03 ක් කැඳවිය යුතු ය.** | | | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | ඉදිකිරීම් වැඩ | 3 දක්වා | - |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 2 දක්වා | - |
| ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්)/ | ඉදිකිරීම් වැඩ | 2 දක්වා | 2 දක්වා |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 1 දක්වා | 1 දක්වා |
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | ඉදිකිරීම් වැඩ | 1 දක්වා | - |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | ලක්ෂ 5 දක්වා | - |
| ගණන් දීමේ නිලධාරීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | ඉදිකිරීම් වැඩ, භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | ලක්ෂ 5 දක්වා | - |

**422.1 (ඇ) සුලු වටිනාකමකින් යුතු අලුත්වැඩියා, වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිල දී ගැනීමේ දී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 සහ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන)**

| බල අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරී සීමාව (රු.) |
|---|---|---|
| ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) | **ඉදිකිරීම් වැඩ**<br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ කොන්ත්‍රාත්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 1,000,000.00 දක්වා |
| | **ඉදිකිරීම් වැඩ**<br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) විසින් සහතික විය යුතු ය.<br>• මෙම අධිකාරය ප්‍රධාන ලේකම්ගේ/ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ/ නියෝජ්‍ය ප්‍රධාන | 500,000.00 දක්වා |

| | | |
|---|---|---|
| | ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්)ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙක් වෙත නොපැවරිය යුතු ය. | |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ සැපයුම්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 500,000.00<br>දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා සෘජුවම වෙළෙඳ පොලෙන් ප්‍රසම්පාදනය කිරීම**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br><br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) සහතික විය යුතු ය.<br><br>• මෙම අධිකාරය ප්‍රධාන ලේකම්ගේ/ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු ය. | 200,000.00<br>දක්වා |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ | **ඉදිකිරීම් වැඩ**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ කොන්ත්‍රාත්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 500,000.00<br>දක්වා |
| | **ඉදිකිරීම් වැඩ**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br><br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී/ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සහතික විය යුතු ය. | 250,000.00<br>දක්වා |

| | | |
|---|---|---|
| | • මෙම අධිකාරය පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ/ ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙක් වෙත නොපැවරිය යුතු ය. | |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ කොන්ත්‍රාත්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 250,000.00 දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා සෘජුවම වෙළෙඳ පොලෙන් ප්‍රසම්පාදනය**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී/ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සහතික විය යුතු ය.<br>• මෙම අධිකාරය පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ/ ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පෞද්ගලික අධීක්ෂණය හා අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළ යුතු ය. | 100,000.00 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රධානීන් | **ඉදිකිරීම් වැඩ**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ කොන්ත්‍රාත්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 250,000.00 දක්වා |
| | **ඉදිකිරීම් වැඩ**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍රාදේශීය ප්‍රධානී විසින් සහතික විය යුතු ය.<br><br>මෙම අධිකාරය ප්‍රාදේශීය ප්‍රධානී ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙක් වෙත නොපැවරිය යුතු ය. | 150,000.00 දක්වා |

| | | |
|---|---|---|
| | **භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට සහ කොන්ත්‍රාත්කරුවන් අතර තරඟයක් නොමැති විට) | 150,000.00 දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා සෘජුවම වෙළෙඳ පොළෙන් ප්‍රසම්පාදනය**<br><br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව සෘජු මිල දී ගැනීමේ දී එහි සඳහන් කොන්දේසි සපුරනු නොලබන විට හා තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කිරීම ආර්ථිකමය වශයෙන් එලදායී නොවන විට)<br><br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් සහතික විය යුතු ය.<br><br>• මෙම අධිකාරය ප්‍රාදේශීය ප්‍රධානී ගේ පෞද්ගලික අධීක්ෂණය හා අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළ යුතු ය. | 50,000.00 දක්වා |
| ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) | **මෝටර් වාහන හා අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීම**<br><br>තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය ආර්ථික වශයෙන් එලදායී නොවන විට;<br>• ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) විසින් ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව සහතික කළ යුතු ය.<br><br>• මෙම අධිකාරය ප්‍රධාන ලේකම්ගේ/ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු ය. | 700,000.00 දක්වා |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ | **මෝටර් වාහන හා අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීම**<br><br>තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය ආර්ථික වශයෙන් එලදායී නොවන විට;<br>• පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී/ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව සහතික කළ යුතු ය.<br><br>• මෙම අධිකාරය පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ/ ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු ය. | 350,000.00 දක්වා |

| | | |
|---|---|---|
| පළාත් අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්) විසින් අධිකාරී බලය පවරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ප්‍රාදේශීය ප්‍රධානීන් | **එක් කාර්යයක් සඳහා එක් දිනක දී රු.20,000.00 නොඉක්මවන පරිදි සුලු වටිනාමකින් යුතු උපකරණ ද ඇතුළු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම**<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරන එවැනි මිල දී ගැනීම්වල එකතුව රු.100,000.00 නොඉක්මවිය යුතු ය. | 20,000.00 දක්වා |
| | **මසක් තුළ රු.100,000.00 ක් නොඉක්මවන පරිදි මෝටර් රථ අලුත්වැඩියා කිරීම** | 100,000.00 දක්වා |
| **මෙම බල අධිකාරිය දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පමණක් අදාළ වේ.** | | |
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරී | **ඉදිකිරීම් වැඩ**<br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන 3.5 හෝ 3.6 අනුව තරඟකාරී ලංසු කැඳවීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන විට)<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරී විසින් සහතික විය යුතු ය.<br>• මෙම අධිකාරී බලය වෛද්‍ය අධිකාරීගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙක් වෙත නොපැවරිය යුතු ය. | 150,000.00 දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා**<br>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට) | 150,000.00 දක්වා |

**මෝටර් රථ වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීමේ දී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 9.3)**

**9.3.1**

(අ) මෝටර් රථ සහ අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීමේ දී ආර්ථික වශයෙන් ඵලදායීබව, වාහනයේ නිෂ්පාදිත වර්ෂය සහ ධාවන තත්ත්වය සැලකිල්ලට ගෙන, මිල ගණන් සාධාරණ බවට ප්‍රසම්පාදිත අස්ථිත්වය සෑහීමකට පත්වන්නේ නම් නිෂ්පාදකයාගේ දේශීය බලයලත් ලත් නියෝජිතයන් මාර්ගයෙන් මෝටර් රථ වාහන සහ අනෙකුත් උපකරණ අළුත්වැඩියා කිරීම සිදු කළ හැකි ය.

(ආ) ප්‍රසම්පාදන අත්පොතෙහි දක්වා ඇති පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අධිකාරී බලය පැවරීමක් කළ හැකි ය. කෙසේ වෙතත් රු.350,000.00 ක් ඉක්මවන අලුත්වැඩියා කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු ය.

ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීමේ දී

| ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන් | |
|---|---|
| පළාත් සභා අරමුදලින් කරනු ලබන ප්‍රසම්පාදනයන්ට අදාළව කටයුතු කිරීමේ දී, ඉතා හදිසි වූ සහ ඉතා විශේෂ වූ කරුණු හේතුවෙන් නියමිත ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැර වීම අවශ්‍ය වන විටෙක, පහත නියම කර ඇති සීමාවන්ට යටත්ව ඒ සඳහා බලය දීමට නිසි අධිකාරියට හැකි ය. එවන් අවස්ථාවල දී ඊට පාදක වන හේතු පැහැදිලිව හා ලිඛිතව වාර්තා කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතු ය. | |
| නිසි අධිකාරිය | ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැර වීම සඳහා අධිකාරී සීමාවන් |
| ප්‍රධාන ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම් (ඔහුගේ පෞද්ගලික අනුමැතිය අවශ්‍ය වේ.) | රු.250,000.00 දක්වා |
| පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු. මිලියන 5 දක්වා |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | රු. මිලියන 10 දක්වා |
| පළාත් අමාත්‍ය මණ්ඩලය | රු. මිලියන 10 ට වැඩි |
| අනුමත කිරීමේ අධිකාරිය | |
| කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රසම්පාදන කමිටුව විසින් කර ඇති නිර්දේශ/ නිර්ණයන් සඳහා පහත සඳහන් අධිකාරීන්ගේ (බලය පැවරීම සම්බන්ධයෙන් මු.රී.83 (මු.රෙ.135) හි සඳහන් විධි විධානයන්ට යටත්ව) අනුමැතිය ලබා ගත යුතු ය. | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ලේකම්/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍ය මණ්ඩලය |

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍ය. විග. දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - දැ.ගැ.පි.

දුරකථන : 091-49 44 007 ෆැක්ස් : 091-22 32 691 විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com